# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023**

**2026 ජනවාරි/පෙබරවාරි**

**සමාජීය විද්‍යා පීඨය**

## ආර්ථික විද්‍යාව
**(නව නිර්දේශය)**

**සංවර්ධන ආර්ථික විද්‍යාව**

**ECON 38224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. "ආර්ථික සංවර්ධනය" පැහැදිලි කොට සංවර්ධන ආර්ථිකවිද්‍යාව විෂයයක් ලෙස වර්ධනය වූ ආකාරය පිළිබඳව විමසීමක් කරන්න.

(ලකුණු 20)

02. රටක සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන දර්ශක දෙකක් පිළිබඳව විස්තර කර ඒවා සංවර්ධනය මැනීමට යොදා ගැනීමේදී පවත්නා සීමා පිළිබඳව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20)

03. (i) දරිද්‍රතාව සඳහා බලපාන සාධක හඳුන්වන්න.

(ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවෙහි බහුමාන දරිද්‍රතාවයෙහි ලක්ෂණ, සංඛ්‍යාදත්ත උපයෝගී කරගනිමින් විශ්ලේෂණය කරන්න.

(ලකුණු 15)

04. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙහිදී මානව ප්‍රාග්ධන සංවර්ධනයෙහි දායකත්වය පිළිබඳව ඇගයීමක් කරන්න.

(ලකුණු 20)

05. ගෝලීයකරණය හඳුන්වා එමගින් සංවර්ධනය වෙමින් පවත්නා රටවල ආර්ථිකය කෙරෙහි සිදු කරන බලපෑම පිළිබඳව විමසීමක් කරන්න.

(ලකුණු 20)

06. (i) 1977න් පසුව ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග පිළිබඳව විමසීමක් කරන්න.

(ලකුණු 10)

(ii) කොවිඩ්-19 වසංගතය ශ්‍රී ලංකාවට මෑතකාලීනව විදේශ ආයෝජන ගලා ඒම සම්බන්ධයෙන් සිදුකළ බලපෑම පිළිබඳව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 10)

07. "සංවර්ධන ප්‍රතිපත්ති" හඳුන්වා ශ්‍රී ලංකාවෙහි සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී මෑතකාලීන ආර්ථික අර්බුදය මඟින් සිදුකළ බලපෑම පිළිබඳව විමසන්න.

(ලකුණු 20)

08. පහත මාතෘකා දෙකක් (02) පිළිබඳව සටහන් ලියන්න.
  (i) ශ්‍රී ලංකා ආර්ථිකයේ මෑතකාලීනව සිදු වූ ව්‍යුහාත්මක වෙනස්කම්
  (ii) ශ්‍රී ලංකාවේ ණය අර්බුදය සහ IMF (ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ) දායකත්වය
  (iii) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටුදැකීමේ වැඩසටහන්වල බලපෑම
  (iv) සැබෑ ප්‍රගති දර්ශකය

(එකකට ලකුණු 10 බැගින්)

****************************